දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650

ලේකම් / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2876169, 011 - 2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/1/AT/2018

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2019.01.22

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

**<u>ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2019</u>**

2018 වර්ෂයේ ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් සිදුකිරීම සම්බන්ධයෙන් නිකුත් කළ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 03/2017 මගින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස නම් කර ඇත.

02. 2019 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු කරන ලද එම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඒකාබද්ධ සේවයේ නිලධාරීන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස නම් කරන ලද්දේ 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන ලෙස හෙයින් අනුමත ස්ථාන මාරු පටිපාටියේ 2.4.1 වගන්තිය පරිදි එදින සිට වසර 05ක කාලයක් එම දෙපාර්තමේන්තුවේ රැඳී සිටීමට ඉඩ දෙන ලෙස ඉල්ලමින් 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර ඇත.

03. එම අභියාචනයන්හි සඳහන් කරුණු ද ඒ සම්බන්ධයෙන් ඔබ විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ හා නිර්දේශ ද සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත තීරණයන්ට එළඹී බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

I. දැනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු හා පූර්වාසන්න වසර 15 තුළ ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05ක කාලයක් සේවය කර ඇති ඒකාබද්ධ සේවයේ නිලධාරීන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු කිරීම.

II. 2018.01.01 දිනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුව සිටි හා එදින සිට ඉදිරියට වසර 05ක කාලයක් එම දෙපාර්තමේන්තුවේම සේවය කිරීමට ඉල්ලා සිටින හා පසුගිය වසර 15 තුළ ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05 කාලයක් සේවය කර නොමැති ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ට ඒ සඳහා ඉඩ දීම.

III. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරනු ලදුව ස්ථාන මාරුවීම් ලැබී ඇති නිලධාරීන්ගේ මනාපය අනුව එම ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම.

04. ඉහත කී රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ අනුව කටයුතු කර, ඒ බව එම කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම සඳහා මා වෙත දන්වා එවන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

05. තවද, 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ අභියාචනාවලට අදාළ තීරණ එම කොමිෂන් සභා වෙබ් අඩවිය මගින්ද ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්.කේ.ආර්.ආර්.රණවීර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභියාචනා අංශය)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්, - කාරුණික දැන ගැනීම සඳහා හා අවශ්‍ය කටයුතු සඳහා
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව